අරණායක ප්‍රාදේශීය සභාව

කෑගල්ල දිස්ත්‍රික්කය .

----------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 24 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 08 සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට අරණායක ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු සුසාන භූමි 13 ක ඉඩම්, ක්‍රීඩා පිටි දෙකක ඉඩම්, මාතෘ නිවාසයක් පිහිටි ඉඩමක්, අම්බලම සහිත ඉඩමක්, පොළ භූමි ගොඩනැගිල්ලක් හා , නිවාස සහිත ඉඩම් කොටස් 2 ක් වටිනාකම් ගණනය කර ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ සිට පැවත එන ගබඩා තොග ගිණුමෙහි රු.103,993 ක් වූ හිඟය සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඇ) අවිච්ඡේද කර්මාන්තයක වටිනාකම වූ රු.100,000 ක් ණයහිමියන් යටතේ වෙන් කිරීමේදී රු.10,000 ක් ලෙස වෙන්කර තිබුණි.

(ඇ) උස්සාපිටිය මහජන පුස්තකාලයේ පොත් 33 ක් හා අරණායක මහජන පුස්තකාලයේ පොත් 05 ක් වශයෙන් එකතුව පොත් 38 ක වටිනාකම මිල කර ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී ආදායම් හා වියදම් වලට අදාලව ප්‍රධාන ලෙජයේ ගිණුම් පවත්වා නොතිබුණි.

(ඊ) සභාව විසින් මිලදී ගනු ලබන ගබඩා ද්‍රව්‍යසටහන් කිරීමේදී ගබඩා පාලන ගිණුමක් හා ණයහිමි ගිණුමක් මාර්ගයෙන් සටහන් කරන වෙනුවට සෘජුවම වැය ශීර්ෂයට හර කර තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

------------------------------

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 කට අදාල මුල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.10,677,214 ක් වූ අතර, ඊට අදාල උපයෝගී ලේඛන වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.10,008,773 ක් වූයෙන් වෙනස රු.668,441 ක් විය.

(ආ) ආදායම් ගිණුම් වාර්තා හා සාරාංශ ආදායම් ලේඛනය (ප්‍රා.ස.19) අනුව නොසැසඳීම් නිරීක්ෂණය විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම

-----------------------

වසර 12 ක සිට ඉදිරියට එන රු.672,333 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.506,154 ක් වූ අතර අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ කර්මාන්ත ණයහිමියෝ රු.100,000 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

1999 හා 2000 වර්ෂ වලට අදාලව රු.45,683 ක් ගෙවීම් කරන ලද තත්කාර්ය අත්තිකාරම් වලට අදාල ගෙවීම් වවුචර් 07 ක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

1.3.6 නීති රීති රෙගුලාසි හා කමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

--------------------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත127 වගන්තිය | සුසානභූමි හා මිනීපිටි ආඥා පනතේ 3 වන වගන්තියේ කාර්යයන් සඳහා ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත එම ආඥා පනතේ නිසි බලධරයා ප්‍රාදේශීය සභාව වුවත් ඇරැව්පොල ග්‍රාමයෙහි පිහිටි සුසාන භූමියක් එකී විධිවිධානයට පටහැනිව හඳබිම අධිකාරිය යටතේ පැවතුණි. |
| (ආ) 2006/12 දරන මුද්දර බදු (විශේෂ විධි විධාන) පනත3 වැනි වගන්තිය | වෙළඳාමක් , ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රැකියාවක් කරගෙන යාමට නිකුත් කරන බලපත්‍ර ගාස්තුවෙන් 10% ක් හෝ රු. 2,000 ක් යන ඒවායින් අඩු මුදල අයකර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළයුතු වුවත් 2014 වර්ෂයේදී රු.24,681 ක මුද්දර බදු මුදලක් ඒ පරිදි අයකරගෙන දේශිය අදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මු.රෙ. 571 | වසර දෙකක් ඉක්මවා තිබූ එකතුව රු.105,140 ක් වූ තැන්පත් 17 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) සබරගමුව පළාතේ පළාත්සභාවේ මුල්‍ය රීති සංග්‍රහය 261.2.2 රීතිය | අවස්ථා 09කදී නිලධාරින් වෙත ලබා දි තිබූ එකතුව රු.131,383 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පියවා නොතිබුණි. |

## 2. මුල්‍ය සමාලෝචනය

### 2.1 මුල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තනවියදම ඉක්මවූ ආදායම රු. 4,537,109 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,686,135ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.6,149,026 ක පිරිහීමක් දක්නට ලැබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මුල්‍ය ප්‍රතිඵලය රු.6,149,026 ක පිරිහීමකට ආදායම් විෂයයන් 05 ක අඩුවීම හා වියදම් විෂයයන් 03 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2014.01.01 දිනට හිගය | 2014.12.31 දිනට හිගයෙන් අයකිරීම | 2014 වර්ෂ යේ බිල් කිරීම් | වර්ෂයේබිල් කිරීම්වලින් අයවීම | 2014.12.31 දිනට හිගය 2014.01.01 දිනට පැවති හිගයෙන් | වර්ෂයේ බිල් කිරීම් වලින් හිහය | මුළු හිහය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| iවරිපනම් හා බදු | 872 | 349 | 1,718 | 1,238 | 523 | 480 | 1,003 |
| ii බදු කුලී | 418 | 117 | 1,598 | 1,577 | 301 | 21 | 322 |
| iiබලපත්‍ර ගාස්තු | 19 | 19 | 545 | 487 | - | 58 | 58 |
| Ivවෙනත් ආදායම් | 6,110 | 5,544 | 12,600 | 1,640 | 566 | 10,960 | 11,526 |

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ශේෂය රු.949,923 ක් වුවත් ඉහත හිග ආදායම් විස්තරයට අනුව ශේෂය රු.1,003,000 ක් විය.

### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 132,000 |
| (ii) | මුද්දර ගාස්තු | 595,163 |
| | | 727,163 |

### 2.3.3 මස්කඩ බදු

පොදු වෙළඳපල අංක 02 කුකුළු මස් කඩය සඳහා ටෙන්ඩර් කැඳවා තෝරාගත් බදුකරුවන් සමඟ ගිවිසුම් වලට එළඹීමකින් තොරව හා මාස තුනක කුලී මුදලකට සමාන ඇප තැන්පත් ලබා ගැනීමකින්ද තොරව 2013 වර්ෂය සහ 2014 වර්ෂය සඳහා බදු දීමෙන් මෙම බදුකරුවන් නොගෙවා පැහැර හැරි රු.92,887 ක මුදල් අයකරගත නොහැකිව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
------------------------------------

සභාව සතු ධාවනයට සුදුසු තත්ත්වයේ කැබ්රථ 02ක් , ට්‍රැක්ටර් 06 ක්, ත්‍රීරෝද රථයක්, මාර්ග තලනයක් හා කෘෂ කැබ්රථයක් තිබුණද සභාවේ රියදුරන් 05 ක් පමණක් සේවයේ යෙදී සිටින නිසා වාහන සංඛ්‍යාවට ප්‍රමාණවත් රියදුරන් සංඛ්‍යාවක් නොමැති බව නිරීක්ෂණය විය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-----------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෛනිකව මාර්ග නඩත්තු කටයුතු සඳහා කම්කරුවන් පස් දෙනෙකු සේවයේ යොදවා තිබුණද , සේවයේ යොදවන ස්ථාන හඳුනාගෙන නොතිබුණි.

(ආ) සභාවට එරෙහිව හා ප්‍රාදේශීය සභාව මඟින් පවරන ලද නඩු සම්බන්ධව සම්පූර්ණ තොරතුරු ඇතුළත් නඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. සභාව වෙනුවෙන් නඩු සඳහා පෙනීසිටි නීතීඥවරුන් විනිවිදභාවයෙන් යුක්තව තෝරාගෙන නොතිබුණු අතර සභාපතිවරයාගේ නම් කිරීම මත සිදුව තිබුණි.

(ඇ) අංක ආර්සී-1409 දරන ට්‍රැක්ටර් රථය රියදුරුගේ නොසැලකිල්ල හේතුවෙන් අනතුරට පත්ව තිබුණි එය අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු කළ මුදලත්, රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කළ මුදලත් අතර වෙනස වූ රු. 35,000 ක මුදල සභාවට පාඩුවක් වී තිබුණි.

(ඈ) නීතිඥවරයෙකුට අවශ්‍ය තොරතුරු නිවැරදිව නොසැපයීම හේතුවෙන් එක් නඩුවක් ඉල්ලා අස්කර ගැනීමටත්, සභාවේ නිලධාරින්ගේ උනන්දුවක් නොමැති බවට උසාවිය හමුවේ ප්‍රකාශයක් නීතිඥවරයා කිරීම හේතුවෙන් ගාස්තුවට යටත් කොට තවත් එක් නඩුවක් නිශ්ප්‍රභා කිරීමත් හේතුවෙන් සභාවට රු.53,728 ක පාඩුවක් දරන්නට සිදුව තිබුණි.

(ඉ) සභාවට අයත් පැරණි ගම්සභා ගොඩනැගිල්ල පදිංචිය සඳහා පුද්ගලයෙකුට 2003 පෙබරවාරි 27 දින බද්දට ලබාදී තිබුණි. එහි ආයුර්වේද මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහාඑම ගොඩනැගිල්ලෙන් එම බදුකරු ඉවත්කර ගැනීමට මාවනැල්ල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරා තිබුණි. එම නඩුවේ තීන්දුව අනුව පදිංචිකරුගේ වාචික ඉල්ලීම මත රජයේ

තක්සේරු කුලිය ඉදිරියේදී ගෙවීමටත්,මෙම නඩුව වෙනුවෙන් රජයට දැරීමට සිදුවූ නඩු ගාස්තු ගෙවීමටත් එකඟ වීමෙන් ඉල්ලා අස්කරගෙන තිබුණි. නඩුව ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව රජයේ තක්සේරු කුලිය වූ රු. 5,000 ක මාසික කුලිය සහ සභාවට දැරීමට සිදුවූ නඩු ගාස්තු වලින් රු.7,100 ක් ද නොගෙවීම මත එම මුදල් සභාවට අලාභයක්ද පැවතුණි. ප්‍රමාද දඩය සමඟනොගෙවූ මාසික බදු කුලිය 2014 වර්ෂය සඳහා පමණක් රු.99,000 ක් විය.

3.3 නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත්ව ඇති රු.625,000 ක් වටිනා අංක 53-5638 දරන කැබ් රථය අනතුරකට ලක්වීමෙන් පසු 2009 වර්ෂයේ සිට ද රු.346,877 ක් වටිනා අංක 49-7099 දරන ට්‍රැක්ටරය ද, රු.79,250 ක් වටිනා අංක 67-0125 දරන ට්‍රේලරය ද, රු.630,000 ක් වටිනා අංක 49-3365 දරන ට්‍රැක්ටරය ද ස්වභාවික උපද්‍රව වලට ලක් වෙමින් උස්සාපිටිය උපකාර්යාල භූමියේ ගාල්කර තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා උපකරණ යටතේ පෙන්නුම් කරන රු.587,289 ක් වටිනා වයිබ්‍රේටින් රෝල හා කම්ෆැක්ට්‍රරය සහ රු.180,000 ක් වටිනා කොන්ක්‍රීට් මිශ්‍රණය ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව ස්වාභාවික උපද්‍රව වලට ලක්වෙමින් උස්සාපිටිය උපකාර්යාල භූමියේ තබා තිබුණි.

3.4 අවිධිමත් ගණුදෙනු

--------------------------

තමන් සතුව වාහනයක් තිබෙන බවට තහවුරු සාක්ෂි ඉදිරිපත් නොකළ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකුට 2012 අගෝස්තු මස සිට 2014 නොවැම්බර් මාසය දක්වා රු.140,000 ක ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.

3.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

--------------------------

2013 වර්ෂයේදී රු.100,000 ක ප්‍රතිපාදන වෙන්කළ වාකිරිගල ප්‍රජාශාලාවට පිවිසෙන පඩිපෙල ඉදිකිරීමේ කර්මාන්තය 2014 දෙසැම්බර් 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

4.1 අයවැය පාලනය.
--------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු අයවැය ලේඛණයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබුණු වැඩ විෂයන් 03 ක එකතුව රු. 24,000 ක ප්‍රතිපාදන 100% ක්ද, වැඩ විෂයයන් 07 ක එකතුව රු.1,800,282 ක ප්‍රතිපාදන වලින් 55% ත් 95% ත් අතර ද වශයෙන් එකතුව රු.1,824,282 ක් අදාල කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ආ) වැඩ විෂයන් 06 ක අනුමත ඇස්තමේන්තු ඉක්මවා රු.1,518,166 ක් වියදම් කර තිබුණි.

(ඇ) ආදායම් ශීර්ෂ 7 ක ඇස්තමේන්තුගත ආදායමින් 50%ත් 99% ත් අතර වූ එකතුව රු.1,419,268 ක ආදායම් උපයා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

(ඈ) ඉහත කරුණු අනුව අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

5. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) අයවැය පාලනය